# 2013

# කාර්යසාධන වාර්තාව

## செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT

## මහා භාරකාර දෙපාර්තමේන්තුව

### பொது நம்பிக்கை பொறுப்பு திணைக்களம்

## Department of Public Trustee



"මේ රටේ නිදහස උත්තරීතරය, කිසිදු බෙදුම්වාදයකට මම ඉඩක් නොතබමි. කිසිම අයකුට අප රටේ ජන සම්මතවාදය විනාශ කිරීමට මම ඉඩ නොදෙන්නෙමි. අපේ රටේ ශිෂ්ටාචාරය ගොඩනැගුනේ මෙත්තා, මුදිතා, කරුණාව තුලිනි. මිනිසා පමණක් නොව සතා සිව්පාවා ගහකොළ මහ පොළව දක්වා පැතිරුණු මෙත් සිත එහි පදනම විය. විවිධ හේතු නිසා ඉරිතැලී ගිය මේ සිත් නැවත එක් ජාතික අරමුණකට ගොනු කරවීම මාගේ අපේක්ෂාවයි. සියල්ලන්ගේ ජාතික හා ආගමික අනන්‍යතාවයන්ට ගරු කිරීම කිසිවෙකුට බලය යොදා හිරිහැර නොකිරීම, පුද්ගල නිදහස හා සමාජ නිදහස සුරැකෙන නව සමාජයක් බිහිකිරීම මාගේ බලාපොරොත්තුව වේ."

- **මහින්ද චින්තන ඉදිරි දැක්ම....** -

**දැක්මඃ**

පරිත්‍යාගශීලි දානපතියන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය අනුව විවිධ කාර්යයන් සඳහා යෙදවීමට පරිත්‍යාගකරන ලද මුදල්/දේපළ අදාළ ස්ථාපකවරුන් ගේ ද තෙස්තමේන්තුකරුවන් ගේ ද පොදු මහජනතාව ගේ ද අභිලාෂයන් සහ අවශ්‍යතාවයන් සපිරෙන පරිද්දෙන් නෛතික රාමුවක් තුළ සැමට උපරිම ප්‍රතිලාභයක් සලසමින් විශ්වාසනීය භාරකරුවෙකු වශයෙන් ක්‍රියකිරීම.

**මෙහෙවර :**

දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද දේපළ, බූදල්, වන්දි සහ මුදල් වෘත්තීමය දැනීම සහ නිපුණතාවය මත පරිපාලනය, කළමනාකරණය සහ ආයෝජනය කරමින් ඒවායේ අර්ථලාභීන්/උරුමකරුවන්/යැපෙන්නන්/ලබන්නන් හට විශ්වාසනීය, කාර්යක්ෂම සහ ඵලදායී සේවාවක් ලබාදීම.

**මහා භාරකාරධූරය හා නෛතික ශක්නුතාවයඃ**

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මගින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාරධූරය, ස්වාධීන අවිච්ජින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිතකොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.

මෙම ධූරයට අමතර වශයෙන් නියෝජ්‍ය මහා භාරකාරධූරයන් දෙකක් උක්ත පනත මගින් ස්ථාපනයකොට ඇත.

නෛතික කාර්ය භාරයක් ඉටුකරන එකී ධූරයන් සඳහා නිළධාරීන් තෝරාපත්කර ගැනීමේ දී ප්‍රධානම සුදුසුකම වන්නේ නීතිඥවරයෙකුවීම ය.

**නෛතික පසුබිම :**

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේ මහා භාරකාරධූරය ස්වාධින නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාළ ආඥා පනත් අනුව ආයතනය සහ ඒ අනුශාංගික කරුණු පාලනය වේ.

භාර සම්බන්ධයෙන් මහා භාරකාර ආඥා පනතට අමතරව 1918 අංක 04, 1934 අංක 1 දරණ ආඥා පනත් මගින් ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මගින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බලපැවැත්වෙන අතර, එකී පනත නිහඬවන්නා වූ යම් අවස්ථාවක දී ඉංග්‍රීසි සාධාරණත්ව (Law of Equity) අදාළ වේ. .

<u>කාර්ය භාරය</u>

මහා භාරකාර ආඥාපනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකාරුවකු, රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කිරීම.
3. බාලවයස්කරුවකු ගේ දේපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක).
4. සිහිවිකල් පුද්ගලයකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක).
5. නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති "භාරකාර මණ්ඩලය" මගින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී).
6. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකු ගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
7. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. ගරු අධිකරණය මගින් පවරන අවස්ථාවල දී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයකු ගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
9. අධිකරණ සංවිධාන පනත මත දේපළ රැස්කරන්නකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගතවුවකු ගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකු ගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
12. විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

උක්ත කාර්යයන් හැර වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාරතැන ගේ මැදිහත්වීම:

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව පැවරී ඇති වෙනත් කාර්යයන්.

- 1988 අංක 61 දරණ පනත මගින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්, විදේශයක දී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදී දීම කාර්යක්ෂම සහ නිවැරදි ලෙස සිදුකිරීම සහ එකී කාර්යය පහසුකිරීම සඳහා අදාළ සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.
- 1944 අංක 42 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
- 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.
- 1973 අංක 28 දරණ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

මහා භාරකාරතැනගෙන් සැලසෙන සේවාවන්:

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති බාරවල අරමුණු අනුව/අන්තිම කැමතිපත්‍රවල ඇති අරමුණු අනුව/අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය කරනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු.
- විවිධ හේතූන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළ සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ගේ නිර්දේශ මත බෙදාහැරීම.

- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය දුෂ්කරතා ඇති දක්ෂ දරුවන් දිරිමත් කිරීම අරමුණු කොට ඇති භාරයන්ගෙන් ආදායම උපයෝගි කරගනිමින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ දෙදෙනෙකු හා සභාපති පත්කිරීම.

- විදේශ වන්දි බෙදාහැරීම.

- විහාර වන්දි බෙදාහැරීම.

- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබාදීම. (2013 වසරේ රුː6,396,102.51ක මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත).

<u>භාර බූදල් සංඛ්‍යාව</u>

2013.12.31 දිනට දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර සංඛ්‍යාව 1019ක් වන අතර, දෙපාර්තමේන්තුව මගින් පාලනය වන බූදල් සංඛ්‍යාව 130කි. භාර ආරම්භ කළ දානපතින් ගේ අරමුණු අනුව අදාල කාර්යයන් ඉටු කරනු ලැබේ.

| වර්ෂය | ක්‍රියාත්මක කරන භාර සංඛ්‍යාව | ක්‍රියාත්මක කරන බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| 2011 | 981 | 119 |
| 2012 | 999 | 126 |
| 2013 | 1019 | 130 |

<u>රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති මුදල් ප්‍රමාණයː</u>

මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති සහ පිහිටුවා ඇති භාර හා බූදල්වලට අදාලව මහා භාරකාර ආඥාපනත යටතේ අය කරනු ලබන මූලධන, ආයෝජන, ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු පහත පරිදි රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.

| වර්ෂය | මුදල (රුː) |
|---|---|
| 2011 | 3,783,187.40 |
| 2012 | 6,543,360.52 |
| 2013 | 6,396,102.51 |

2013.12.31 දිනට දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ යෙදෙන සංඛ්‍යාව | පුරප්පාඩුව |
|---|---|---|---|---|---|
| 01 | මහා භාරකාරතැන | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය මහා භාරකාරතැන | දෙපාර්තමේන්තුගත | 02 | 01 | 01 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. (I පන්තිය) | 01 | 01 | - |
| 04 | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. (II/III පන්තිය) | 01 | 01 | - |
| 05 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. (I පන්තිය) | 01 | 01 | - |
| 06 | පරිපාලන නිලධාරි | රා. ක.ස. සේ. (අධි පන්තිය) | 01 | 01 | - |
| 07 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 01 | 01 | - |
| 08 | සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරි | 07 | 06 | 01 |
| 09 | සංවර්ධන නිලධාරී | සංවර්ධන නිලධාරී | 07 | 01 | 06 |
| 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. කළ. ස. සේවය | 28 | 24 | 04 |
| 11 | කාර්යාල සේවක සේවය | කා. සේ. සේ. | 13 | 13 | - |
| 12 | රියදුරු | රියදුරු සේවය | 04 | 03 | 01 |
| 13 | ලිපිකරු | දෙපාර්තමේන්තුගත | 03 | 02 | - |
| 13 | යතුරු ලේඛක | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| **එකතුව** | | | **71** | **57** | **13** |

❖ *දෙපාර්තමේන්තුගත ලිපිකරු තනතුර පුරප්පාඩු සඳහා අනුමැතිය ලැබී ඇත්තේ එම තනතුර පුරප්පාඩු වූ පසු නැවත පිරවීමට අවසර නොලැබෙන ලෙස ය.*

මෙම දෙපාර්තමේන්තුව භාරයේ පවතින භාර හා බූදල් යටතේ 2013/12/31 දිනට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වැඩසටහන්

| විස්තරය /Description | වෙන් වූ ප්‍රතිපාදන /Allocated Funds (000) | ක්‍රියාකාරකම් /Activity |
|---|---|---|
| ශිෂ්‍යාධාර ගෙවීම | 3,690 | අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂතාවය ඇති දරුවන්ට උපකාර කිරීම සඳහා ඔවුන් ගේ අධ්‍යාපනික ක්ෂේත්‍රය හා අධ්‍යාපනික මට්ටම පදනම් කරගෙන මාසිකව රු:300, රු:500, රු:1,000 වශයෙන් දරුවන් 680ක් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම. |
| වෛද්‍යාධාර ගෙවීම | 14,993 | මේ යටතේ අසරණ වූ, වකුගඩු හදවත් සැත්කම් සහ පිළිකා රෝගීන් 381ක් සඳහා ආධාර ලබා දෙන ලදි. |
| ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය | 66,560 | ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ආගමික ස්ථාන 745කට ආධාර ලබා දී ඇත. |
| පුණ්‍යාධාර ලබාදීම | 11,224 | භාරයන්හි ස්ථාපකවරුන් හා ඔවුන් විසින් නම්කර ඇති අයට පිං පැමිණවීමේ අරමුණින් විවිධ ආගමික ස්ථාන හා ආයතන 211කට ආධාර ලබාදීම. |
| අසරණාධාර ගෙවීම | 817 | ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයින්ට සහ එවැනි අය රැකබලා ගන්නා ආයතන 101කට ආධාර ලබාදීම. |
| භාර අරමුණු අනුව වෙනත ගෙවීම් | 94,520 | ළමා නිවාස වැඩිහිටි නිවාස ආබාධිත පුද්ගලයින් සිටින ආයතන 107කට ආධාර ලබාදීම. |
| විදේශ වන්ද ලැබීම | 184,095 | විදේශයන්හි මියගිය පුද්ගලයින් 123 දෙනෙකු වෙනුවෙන් නීත්‍යානුකූල උරුමකරුවන් තහවුරු කරගැනීමෙන් අනතුරුව උරුමකරුවන් 331කට වන්දි මුදල් ලබා දී ඇත. |
| විහාර වන්දි ලැබීම | 69,626 | අවස්ථා 60ක දි විහාරස්ථාන 44ක් සඳහා වන්දිමුදල් හා පොලී ලබා දී ඇත. |

<u>2013 වර්ෂය සඳහා විහාරාධාර ලබාදීම.</u>

| බූදලය | මුදල (රු.) | විහාරස්ථාන ගණන |
|---|---|---|
| වනිගසූරිය බූදලය | 629,712.00 | 16 |
| එකතුව | 629,712.00 | 16 |

රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන මගින් ඉටුකරනු ලබන කාර්යයන් - 2013.12.31 දිනට

| විෂය අංකය | විෂය විස්තරය | නිත්‍ය ප්‍රතිපාදන | 2013/12/31 දිනට මුලු වියදම | ඉතිරි ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | | | |
| 1001 | වැටුප් හා වේතන | 12,810,000/- | 12,703,214.21 | 106,785.79 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 600,000/- | 599,445.03 | 554.97 |
| 1003 | වෙනත් දීමනා | 7,959,000/- | 7,934,015.00 | 24,984.12 |
| 1101 | දේශීය | 264,000/- | 263,630.30 | 369.70 |
| 1102 | විදේශීය | - | - | - |
| 1201 | ලිපි හා කාර්යාල අවශ්‍යතා | 1,000,000/- | 997,850.08 | 2,149.92 |
| 1202 | ඉන්ධන | 1,677,000/- | 1,656,307.10 | 20,692.90 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 20,000/- | 20,000.00 | 00.00 |
| 1301 | වාහන | 1,158,500/- | 1,091,091.92 | 67,408.08 |
| 1301 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 373,000/- | 355,810.04 | 17,189.96 |
| 1401 | ප්‍රවාහන | 200/- | 200.00 | - |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 865,000/- | 759,288.54 | 105,711.46 |
| 1403 | විදුලිය හා ජලය | 920,000/- | 831,586.52 | 88,413.48 |
| 1404 | බදු කුලී හා පලාත් පාලන ආයතන | 5,400,000/- | 5,400,000/- | - |
| 1405 | වෙනත් | 1,490,000/- | 1,362,292.86 | 127,707.14 |
| 1506 | දේපළ ණය පොලී | 294,500/- | 294,438.03 | 61.97 |
| | **පුනරාවර්තන එකතුව** | **34,831,200/-** | **34,269,170.51** | **562,029.49** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 300,000/- | 42,549.84 | 257,450.16 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000/- | 20,600.00 | 279,400.00 |
| 2003 | වාහන | 500,000/- | 288,001.00 | 211,999.00 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 755,800/- | 392,049.30 | 363,750.70 |
| 2013 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,635,000/- | 966,858.25 | 668,141.75 |
| 2104 | පුහුණු කිරීමේ හා රැකියා වර්ධනය | 150,000/- | 36,500.00 | 113,500.00 |
| | මූලධන එකතුව | 3,640,800/- | 1,746,558.39 | 1,894,241.61 |
| | **මුලු එකතුව** | **38,472,000/-** | **36,015,728.90** | **2,456,271.10** |

**රජයේ වාර්ෂික අය වැය ලේඛනය මගින් පසුගිය වසර තුන සඳහා වෙන් කළ ප්‍රතිපාදන**

මූල්‍ය ප්‍රගතිය

| | ශුද්ධ වෙන් කිරීම් | වියදම් |
|---|---|---|
| **2011** | | |
| පුනරාවර්තන | 29,737,383 | 29,301,643 |
| මූලධන එකතුව | 1,383,617 | 1,295,184 |
| **මුලු එකතුව** | **31,121,000** | **30,596,827** |
| | | |
| **2012** | | |
| පුනරාවර්තන | 29,850,648 | 29,716,129 |
| මූලධන එකතුව | 922,809 | 763,739 |
| **මුලු එකතුව** | **30,773,457** | **30,479,868** |
| | | |
| **2013** | | |
| පුනරාවර්තන | 34,831,200 | 34,269,170 |
| මූලධන එකතුව | 3,640,800 | 1,746,558 |
| මුලු එකතුව | **38,472,000** | **36,015,728** |

**විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන වාර්ෂික අයවැය ලේඛනය මගින් මෙම දෙපාර්තමේන්තුවට වෙන් කිරීමක් ද සිදු නොවේ.**